# වී හා එළවළු භෝග සඳහා සාර්ථක කාබනික දියරයක් ...

මෙය අත්හදා බලන ලද සාර්ථක කාබනික දියර පොහොරක් බැවින් එය ඔබගේ ගෙවත්තේ පහත සඳහන් අන්දමට සාදගත හැකිය. එමෙන් ම, එය ගෙවත්තේ වගා කොට ඇති භෝගවලට යොදා ගැනීමේ හැකියාව ද පවතී.

### අවශ්‍ය ද්‍රව්‍ය

(i) මේ සඳහා ප්ලාස්ටික් බැරලයක් (පියන සහිත) අවශ්‍ය වේ.

(ii) එළ ගොම (මී ගොම නොවේ) බාල්දි 02

(iii) ගිනිසීරියා (ඇල්බීසියා) කොළ සෑහෙන ප්‍රමාණයක්

(iv) ගඳපාන කොළ සෑහෙන ප්‍රමාණය

(ගඳපාන කොළ සොයා ගැනීමට නොහැකි නම් ඒ සඳහා ගම්මිරිස් කොළ, ආඩතෝඩ කොළ, කැප්පෙටියා කොළ, මුරුංගා කොළ දැමිය හැකිය.)

### පිළියෙල කර ගන්නා ආකාරය

පළමුව ප්ලාස්ටික් බැරලය හොඳින් සෝදා එයට එළ ගොම බාල්දි 02ක් දමන්න. පසුව, එයට එම බාල්දියේ ප්‍රමාණයෙන්ම වතුර බාල්දි 04ක් දමන්න. පසුව එය ගිනිසීරියා (ඇල්බීසියා) කිනිති අගිස්සේ කිනිති ද සමඟ බැරලයට දමන්න. පසුව ගඳපාන අතු එයට දමා හොඳින් කලවම් කර පියනෙන් වසා දින 14ක් තබන්න. දින 14ක් ගෙවී ගිය පසු කෝටුවකින් හොඳින් කලවම් කර ඇතුළට දමන ලද අතු කිනිති වල නාරටි ඉවතට දමන්න. කොළ පමණක් තිබෙන්නට හරින්න. පසුව පියනෙන් වසා දින 21ක් යන තුරු තබන්න. දින 21ක් ගිය පසු බැරලයේ පියන හැර හොඳින් කලවම් කර පෙනේරයකින් හෝ දලකින් පෙරන්න. පෙරාගත් දියරයට වතුර ලීටර් 1.5 ක් යොදා ගොයමට ඉසීමට යොදා ගන්න. එමෙන්ම වතුර ලීටර් 1.6ක් යොදා එළවළු වර්ග, අනෙකුත් භෝග වර්ග හෝ මල් පැළ වලට දමන්න.

මෙම කාබනික පොහොර දියරය ස්ප්‍රේ කිරීමට ද පුළුවන. එබැවින් මෙම සාර්ථක පොහොර දියරට ඔබගේ ගෙවත්තට හෝ කුඹුරට යෙදිය හැක.

*(පොල්ගස්මිටිට කෘෂිකර්ම පර්යේෂණ සහකාර පර්ලි මහත්මිය විසින් ගොවි සංවිධාන රැස්වීමක දී කරන ලද දේශනයක් ඇසුරෙනි.)*

**සරත් විජයගුණවර්ධන මහතා**
අලෙවි සහකාර
ප්‍රකාශන ඒකකය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**ගොවි ජනතා ඉදිරි කලාප .....**

2009 වසරේ නිකුත් වන ගොවි ජනතා සඟරාව මඟින් පාඨක ඉල්ලීම් මත ඩ්‍රැගන් ෆෘට් වගාව සම්බන්ධ විශේෂ ලිපියක් ප්‍රකාශයට පත් වේ. එබැවින්, සිදුවන දුෂ්කරතා අවම කර ගැනීම සඳහා මෙම සඟරාවේ පිටපත් කල්තබා මිල දී ගැනීමට පාඨක ඔබගේ අවධානය යොමු කරවීමට කැමැත්තෙමු.

- සංස්කාරක -